[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | පත්‍රය I | පැය - 01 යි. |
|---|---|---|---|

නම ..................................................................

සැලකිය යුතුයි;
- **ප්‍රශ්න අංක 1 සිට 40 දක්වා සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව 40කි.**

**1 පත්‍රය**

(01) බුදු සසුනේ තනතුරු ප්‍රදානය ගැන අතෘප්තිමත්ව සිටි භික්ෂුව වූයේ,
(1) ආනන්ද හිමි ය. (2) සැරියුත් හිමි ය. (3) ඡන්න හිමි ය. (4) මුගලන් හිමි ය.

(02) බුදු හිමියන් ඇතැම් වස්කාල ඉතා දුෂ්කර ලෙස ප්‍රත්‍ය පහසුකම් වත් නොලබමින් ගත කළ සේක. එවැනි වස් කාලයකට නිදසුනකි.
(1) බේළුව ගමේ වස්කාලය වැඩ සිටීම.
(2) වේරංජාවේ වස් කාලය වැඩ සිටීම.
(3) ජේතවනාරාමයේ වස් කාලය වැඩ සිටීම.
(4) වේළුවනාරාමයේ වස් කාලය වැඩ සිටීම.

(03) ගිලනුන්ට උපස්ථාන කරන්නා මට උපස්ථාන කරන්නේ ය, යනුවෙන් ප්‍රකාශ කරනු ලැබූයේ,
(1) පූතිගත්ත තිස්ස තෙරණුවන්ට උපස්ථාන කළ අවස්ථාවේදී ය.
(2) උදරාබාධයකින් පෙළුණු භික්ෂූන්ට උපස්ථාන කළ අවස්ථාවේදී ය.
(3) සුනීතට උපස්ථාන කළ අවස්ථාවේදී ය.
(4) මුගලන් මහරහතන් වහන්සේට උපස්ථාන කළ අවස්ථාවේදී ය.

(04) බුදු රදුන් නින්දා, ප්‍රසංසා හමුවේ නොසැලී සිටියහ.මෙම ගුණය,
(1) පුරිස ධම්ම සාරථී ගුණය යි.
(2) තාදී ගුණය යි.
(3) අසරණ සරණ ගුණය යි.
(4) ගිලනුන්ට උපස්ථාන කිරීමේ ගුණය යි.

(05) බෝසතාණන් වහන්සේ නෙක්ඛම්ම පාරමිතාව පූරණය කළ අවස්ථාව දැක්වෙන ජාතක කතාව වන්නේ,
(1) සස ජාතකය යි.
(2) මඛා දේව ජාතකය යි.
(3) වෙස්සන්තර ජාතකය යි.
(4) සීලවිමංස ජාතකය යි.

(06) තේමිය ජාතකයෙන් ප්‍රකට වන පාරමිතාව වන්නේ,
(1) දාන පාරමිතාව යි.
(2) මෛත්‍රී පාරමිතාව යි.
(3) අධිෂ්ඨාන පාරමිතාව යි.
(4) සත්‍ය පාරමිතාව යි.

(07) පුද්ගලයකු යම් කාර්යයක් ආරම්භ කිරීමේ දී ඇතිකර ගත යුතු වීර්යය වන්නේ,
(1) නික්ඛම ධාතු ය.
(2) ආරම්භක ධාතු ය.
(3) පරක්කම ධාතු ය.
(4) ඉහත සියල්ල ම ය.

(08) "දූරංගමං ඒකචරං අසරීරං ගුහාසයං..."යන ගාථාවෙන් විස්තර කරන්නේ,

(1) කයේ ස්වභාවය යි.
(3) සිතේ ස්වභාවය යි.
(2) ඇසේ ස්වභාවය යි.
(4) පංචේන්ද්‍රියන් ගේ ස්වභාවය යි.

(09) මෙත්තා,කරුණා,මුදිතා,උපේක්ඛා යනු,

(1) සතර කර්ම ක්ලේෂය යි.
(3) සතර අගතිය යි.
(2) සතර සංග්‍රහ වස්තුව යි.
(4) සතර බ්‍රහ්ම විහරණ යි.

(10) කම්සැප විඳීමට ඇති කැමැත්ත බුදුදහමේ විස්තර කර ඇත්තේ,

(1) කාමච්ඡන්දය ලෙස ය.
(3) විචිකිච්චාව ලෙස ය.
(2) ව්‍යාපාදය ලෙස ය.
(4) ථීන මිද්ධය ලෙස ය.

(11) පුද්ගල චරිත අතර මෝඩකම හෙවත් මුලාව අධික චරිත හඳුන්වා ඇත්තේ,

(1) මෝහ චරිත යනුවෙනි.
(3) විතර්ක චරිත යනුවෙනි.
(2) ශ්‍රද්ධා චරිත යනුවෙනි.
(4) බුද්ධි චරිතය යනුවෙනි.

(12) "ධර්ම විනිශ්චය" නැමැති ඉතා වටිනා ග්‍රන්ථය රචනා කළ රචකයා වූයේ,

(1) වැලිවිට සරණංකර හිමි ය.
(3) ඕල්කට්තුමා ය.
(2) රේරුකානේ චන්ද්‍රවිමල හිමි ය.
(4) අනගාරික ධර්මපාල තුමා ය.

(13) පරම විඥානාර්ථ බෞද්ධ සමාගම මගින් ආරම්භ කළ පුවත්පත වූයේ,

(1) සිංහල බෞද්ධයා පුවත්පත ය.
(3) බුදු සරණ පුවත්පත ය.
(2) සරසවි සඳරුස පුවත්පත ය.
(4) ලංකාලෝක පුවත්පත ය.

(14) "සිංහලයිනි නැගිටිච් බුද්ධගයාව බේරාගනිච්..." යන අභීත නාදයෙන් බොදු හදවත් අවදි කළේ,

(1) අනගාරික ධර්මපාල තුමා ය.
(3) ඕල්කට්තුමා ය.
(2) රේරුකානේ චන්ද්‍රවිමල මහ නාහිමි ය.
(4) දුටුගැමුණු රජතුමා ය.

(15) ධම්ම පදය කෘතිය සූත්‍ර පිටකයේ කුමන නිකායට අයත් වේ ද?

(1) දීඝ නිකායට.
(3) අංගුත්තර නිකායට.
(2) ඛුද්දක නිකායට.
(4) මජ්ඣිම නිකායට.

(16) පුද්ගල දියුණුව,උත්සාහය ගැන කරුණු ඇතුළත් ධම්මපද ගාථාව නම්,

(1) අක්කොච්ජි මං අවධි මං... යන ගාථාවයි.
(2) නතං කම්මං කතං සාධු... යන ගාථාවයි.
(3) අත්තනාව කතං පාපං... යන ගාථාවයි .
(4) උට්ඨානවතෝ සතිමතෝ...යන ගාථාවයි.

(17) "කාලා රසමුසු බෝජන කැර පෙම්... "යන කවිය ඇතුළත් දහම් ග්‍රන්ථය වන්නේ,

(1) ලෝවැඩ සඟරාව කෘතිය යි.
(3) බුදුගුණ අලංකාරය කෘතිය යි.
(2) ලෝකෝපකාරය කෘතිය යි.
(4) සිරිත් මල්දම කෘතිය යි.

(18) සීලයේ ප්‍රභේද ගණනාවක් දැකිය හැකිය. ඒ අතරින් ගිහියාගේ නිත්‍ය ශීලය ලෙස හඳුන්වන්නේ,

(1) අෂ්ඨාංගික උපෝසථ ශීලය යි.
(3) දස සීලය යි.
(2) පංච ශීලය යි.
(4) ආජීව අෂ්ටමක සීලය යි.

(19) මෙලොව පරලොව හිතසුව පිණිස හේතුවන කරුණු පිළිබඳව දීඝජානු කෝලිය සිටු පුත්‍රයා අරබයා දේශනා කළ සූත්‍ර දේශනාව වන්නේ,

(1) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.
(2) රතන සූත්‍රය යි.
(3) මංගල සූත්‍රය යි.
(4) පරාභව සූත්‍රය යි.

(20) මෙලොව දියුණුවට හේතුවන මංගල කරුණු කීයක් මංගල සූත්‍රය තුළ ඇතුළත් වන්නේ ද?

(1) 30කි. (2) 34කි. (3) 38කි. (4) 40කි.

(21) බුදු දහමේ සඳහන් වන ධාර්මික රැකියා ගණයට අයත් නොවන රැකියාව වන්නේ,

(1) කෘෂිකර්මාන්තය යි.
(2) වෙළඳාම යි.
(3) ගවයන් රැක බලා ගැනීම යි.
(4) අවි ආයුධ වෙළඳාම යි.

(22) පුද්ගලයාගේ සිතීමේ හා විමසීමේ නිදහස පිළිබඳව විස්තර කරමින් දේශනා කළ සූත්‍ර දේශනාව මින් කුමක්ද?

(1) කාලාම සූත්‍රය.
(2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
(3) පරාභව සූත්‍රය.
(4) කරණීයමෙත්ත සූත්‍රය.

(23) සැප දුක දෙකෙහිදීම තමා හා අනුන් සමාන ලෙස සලකා ක්‍රියා කිරීමේ මා හැඟි ගුණාංගය බුදු දහමේ හඳුන්වා ඇත්තේ,

(1) අටලෝ දහම ලෙස ය.
(2) සමානාත්මතාවය ලෙස ය.
(3) පරාර්ථ කාමීත්වය ලෙසය.
(4) ආත්මාර්ථ කාමීත්වය ලෙස ය.

(24) බුදු දහමට අනුව අන් සැපතට ඊර්ෂ්‍යා කරන්නා උපත ලබන්නේ,

(1) මහේශාක්‍යව ය. (2) අල්පේශාක්‍යව ය. (3) දුර්වර්ණව ය. (4) ආබාධ රහිතව ය.

(25) මෙලොව දක්නට ලැබෙන පුද්ගල විසමතා 14ක් පිළිබඳව සඳහන්වන සූත්‍ර දේශනාව වන්නේ,

(1) චූල්ලකම්ම විභංග සූත්‍රය යි.
(2) පරාභව සූත්‍රය යි.
(3) කාලාම සූත්‍රය යි.
(4) රතන සූත්‍රය යි.

(26) අප කරන කර්මවලට විපාක ලැබෙන බව බුදු දහම පෙන්වා දෙයි. ඒ අනුව අඩු ආයුෂයෙන් මිය යනු ලබන්නේ,

(1) ප්‍රාණඝාත නොකරන්නා ය.
(2) ප්‍රාණඝාත කරන්නා ය.
(3) සත්ව හිංසාව සිදුකරන්නා ය.
(4) ද්වේෂයෙන් කටයුතු කරන්නා ය.

(27) තණ්හාව මුල් කොටගෙන සමාජයේ කලකෝලාහල ඇතිවන අයුරු පටිච්ච සමුප්පාදයට අනුව පෙන්වා දෙන සූත්‍ර දේශනාව නම්,

(1) මහා නිධාන සූත්‍රය යි.
(2) චක්කවත්ති සීහනාද සූත්‍රය යි.
(3) අග්ගි වච්ඡගොත්ත සූත්‍රය යි.
(4) පරාභව සූත්‍රය යි.

(28) හේතුඵල දහමින් මනා ලෙස පැහැදිලි කරන ධර්මතාවය වන්නේ,

(1) ඇතිවීම පිළිබඳ ව ය.
(2) නැතිවීම පිළිබඳව ය.
(3) පැවතීම පිළිබඳව ය.
(4) ඇතිවීම, පැවතීම, නැතිවීම පිළිබඳව ය.

(29) අගසව් දෙනමට බුදු දහම පිළිබඳව මුල්ම අවබෝධය ලබා දුන් ගුරුවරයා වූයේ,

(1) ආනන්ද තෙරුන් ය.
(2) මහා කාශ්‍යප තෙරුන් ය.
(3) අස්සජි තෙරුන් ය.
(4) දෙව්දත් තෙරුන් ය.

(30) වනරෝප සූත්‍රයට අනුව දිවා රෑ පින් වැඩෙන ක්‍රියාවක් නො වන්නේ,

(1) වන වගා කිරීම.
(2) ඒ දඬු පාලම් තැනීම.
(3) ආවාස සකස් කරදීම.
(4) මාලිගා තනා දීම.

(31) බුදුන් වහන්සේ කළගුණ දැක්වීමේ අවස්ථාවකට උදාහරණයකි,

(1) මුචලින්ද නාග දරණ යට වැඩ සිටීම.
(2) රුවන් සක්මන.
(3) අනිමිස ලෝචන පූජාවේ යෙදීම.
(4) අජපාල නුගරුක මුල වැඩ සිටීම.

(32) භික්ෂූන් වහන්සේලාගේ කායික නිරෝගීතාවය උදෙසා ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම මත බුදුරජාණන් වහන්සේ අනුමත කළ ප්‍රායෝගික ක්‍රියා කාරකමක් වූයේ,

(1) සක්මන් මළුවේ සක්මන් කිරීමයි.
(2) මෛත්‍රී භාවනාවේ යෙදීම යි.
(3) නියමිත වේලාවට ආහාර ගැනීම යි.
(4) නිදා ගැනීම යි.

(33) ලෝවැඩ සඟරාව නම් කෘතියට අනුව "සත් හට වන බව දුකට වෙදාණන්..." යන පාඨයෙන් අර්ථ ගන්වනු ලැබුයේ,

(1) මහා කාශ්‍යප තෙරුන්ව ය.
(2) බුදුරජාණන් වහන්සේව ය.
(3) මුගලන් තෙරුන්ව ය.
(4) සැරියුත් තෙරුන්ව ය.

(34) "පුස්තකාරූඪ සංගීතය" ලෙස හඳුන්වනු ලැබුවේ කුමන ධර්ම සංගායනාව ද?

(1) පලවෙනි ධර්ම සංගායනාව ය.
(2) දෙවන ධර්ම සංගායනාව ය.
(3) තෙවන ධර්ම සංගායනාව ය.
(4) අලුවිහාර සංගායනාව ය.

(35) පංචස්කන්ධය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ඇස,කන,නාසය,දිව,ශරීරය
(2) රූප,වේදනා,සඤ්ඤා,සංඛාර,විඤ්ඤාණ
(3) ආයුෂය,වර්ණය,සැපය, බලය,ප්‍රඥාව
(4) විතක්ඛ,විචාර,ප්‍රීති,සුඛ,ඒකග්ගතා

(36) කාලාශෝක රජුගේ අනුග්‍රහයෙන් පවත්වන ලද ධර්ම සංගායනාව කුමක්ද?

(1) ප්‍රථම ධර්ම සංගායනාව.
(2) තෙවන ධර්ම සංගායනාව
(3) දෙවන ධර්ම සංගායනාව
(4) සිව්වන ධර්ම සංගායනාව.

(37) "ථිනමිද්ධ" යනුවෙන් හඳුන්වනු ලබන්නේ?

(1) තරහව යි.
(2) සිතෙහි නොසන්සුන් බව යි.
(3) සැකය යි.
(4) සිත කයෙහි උදාසීන බව යි.

(38) ධර්මධර හා විනයධර භික්ෂූන් අතර ඇති වූ ගැටලුවක් සමථයකට පත්නොවූ නිසා බුදු හිමියන් වැඩම කළේ කුමන ස්ථානයකට ද?

(1) පාරිලෙය්‍ය වනයට.
(2) ජේතවනාරාමයට.
(3) වේළුවනාරාමයට.
(4) කොසඹෑ නුවරට.

(39) ධම්ම පදය කෘතියෙහි ඇතුළත් වග්ග, ගාථා හා නිධාන කතා නිවැරදිව ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) වග්ග423 ගාථා 26 නිධාන කතා 299 යි.
(2) වග්ග26 ගාථා 423 නිධාන කතා 299 යි.
(3) වග්ග26 ගාථා 299 නිධාන කතා 423 යි.
(4) වග්ග23 ගාථා 423 නිධාන කතා 299 යි.

(40) සරණංකර හිමියන් පිහිට වූ සමාගම හඳුන්වනු ලැබුවේ,

(1) සිල්වත් සමාගම ලෙස ය.
(2) මහබෝධි සමාගම ලෙස ය.
(3) පරම විඥානාර්ථ සමාගම ලෙස ය.
(4) බෞද්ධ මධ්‍යස්ථානය ලෙස ය.

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | පත්‍රය II | පැය - 02 යි. |
|---|---|---|---|

නම ....................................................

**සැලකිය යුතුයි;**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව 60කි.**

**<u>II පත්‍රය</u>**

**1) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i. බුදුරජාණන් වහන්සේට මුහුණ දීමට සිදු වූ අභියෝග දෙකක් ලියන්න.
ii. බුදු බුදුහිමියන් තුළ තිබූ පුරිසදම්ම සාරථී ගුණයට උදාහරණ දෙකක් ලියන්න.
iii. "දානං සීලංච නෙක්ඛම්මං..." යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.
iv. සම්මා වාචාවලට අයත් කරුණු දෙකක් නම් කරන්න.
v. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ඇතුළත් ධනය විනාශ වී යා හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න.
vi. සතර සංග්‍රහ වස්තු නම් කරන්න.
vii. "ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්මිං අසති ඉදං න හෝති" මෙහි අර්ථය ලියා දක්වන්න.
viii. පරිසරය බෙදෙන ප්‍රධාන කොටස් දෙක සඳහන් කරන්න.
ix. ආහාර පමණ දැන අනුභව කිරීම පිළිබඳව සඳහන් සූත්‍රය නම් කරන්න?
x. පරාභව සූත්‍රයේ දැක්වෙන පුද්ගලයාගේ පිරිහීමට හේතුවන කරුණු දෙකක් සඳහන් කරන්න. **(ලකුණු 2 x 10 =20)**

(2) (1) "අත්තනාව කතං පාපං - අත්තනා සං කිලිස්සති..." යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න. **(ලකුණු 2)**
(2) එහි අර්ථය ලියා දක්වන්න. **(ලකුණු 3)**
(3) පුද්ගල ජීවිතය සාර්ථක කරගැනීම උදෙසා ධම්මපදයෙන් ලබාගත හැකි පිටිවහල කෙබඳු දැයි පැහැදිලි කරන්න. **(ලකුණු 5)**

(3) (1) භාවනාව බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
(2) ඉන් එක් භාවනා ක්‍රමයක් කෙටියෙන් හඳුන්වන්න.
(3) භාවනාව තුළින් තමාට ලබා ගතහැකි ප්‍රයෝජන පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

(4) (1) පළමු සංගායනාව පැවැත්වූ ස්ථානය හා සහාය දුන් රජතුමා කවුරුන් ද?
(2) පළමු සංගායනාවට හේතුව හා සහභාගී වූ සංඛ්‍යාව, මූලිකත්වය ගත් මහරහතන් වහන්සේලා කවුරුන් දැයි සඳහන් කරන්න.
(3) ධර්මය හා විනය සුරක්ෂිත කිරීමෙහිලා පළමු ධර්ම සංගායනාවෙන් ගත් පියවර පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(5) (1) පරිසරය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.
(2) ස්වාභාවික පරිසරයෙන් අපට ඇති වාසි තුනක් ලියන්න.
(3) බුදුරජාණන් වහන්සේ පරිසරය බොහෝ අගය කළහ.ස්වාභාවික පරිසරය රැක ගැනීමට ඔබට කළ හැකි යෝජනා මොනවාදැයි සඳහන් කරන්න.

(6) (1) මංගල සූත්‍රයේ ඇතුළත් කරුණුවලින් දෙකක් සඳහන් කරන්න.
(2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ඇතුළත් මෙලොව හිත සුවපිණිස හේතුවන කරුණු 4න් තුනක් ලියන්න.
(3) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි ඇතුළත් කරුණු මෙලොව දියුණුවට හේතුවන ආකාරය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.

(7) පහත සඳහන් මාතෘකා අතරෙන් දෙකකට කෙටි සටහන් ලියන්න.
(1) පාරමිතා
(2) අනගාරික ධර්මපාල තුමා.
(3) ආර්ය අෂ්ටාංගික මාර්ගය.
(4) සීලය. **(ලකුණු 5+5 =10)**

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | පත්‍රය I/II |
|---|---|---|

## පිළිතුරු පත්‍ර

### පිළිතුරු පත්‍රය - I

- ප්‍රශ්න අංක **1** සිට **40** දක්වා ප්‍රශ්නවලට ලකුණු **1** බැගින් මුළු ලකුණු **40**කි.

| | | | |
|---|---|---|---|
| (1) - 3 | (11) - 1 | (21) - 4 | (31) - 3 |
| (2) - 2 | (12) - 2 | (22) - 1 | (32) - 1 |
| (3) - 1 | (13) - 2 | (23) - 2 | (33) - 2 |
| (4) - 2 | (14) - 1 | (24) - 2 | (34) - 4 |
| (5) - 2 | (15) - 2 | (25) - 1 | (35) - 2 |
| (6) - 3 | (16) - 4 | (26) - 2 | (36) - 3 |
| (7) - 2 | (17) - 1 | (27) - 1 | (37) - 4 |
| (8) - 3 | (18) - 2 | (28) - 4 | (38) - 1 |
| (9) - 4 | (19) - 1 | (29) - 3 | (39) - 2 |
| (10) - 1 | (20) - 3 | (30) - 4 | (40) - 1 |

**(ලකුණු 1 x 40 = 40)**

### පිළිතුරු පත්‍රය - II

- පළමු ඇගයීම් ප්‍රශ්නයේ එක කොටසකට ලකුණු **2** බැගින් මුළු ලකුණු **20**කි.

(1) i. බුදු සිරිතේ අභියෝග අතරෙන් බුද්ධත්වයට පත් වූ පසුව මුහුණ දීමට සිදු වූ අභියෝග දෙකක් පෙළගස්වා ඇත්නම් ලකුණු දෙකක් ලබා දෙන්න.

ii. අංගුලිමාල, සූචිරෝම, ඛරරෝම වැනි යක්ෂයින් දමනය කිරීම. නාලාගිරි හස්තිරාජයා, සච්චක, නිගණ්ඨ දමනය කිරීම... ආදී උදාහරණ දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකක් ලබා දෙන්න.

iii. "දානං සීලං ච නෙක්ඛම්මං - පඤ්ඤා විරියේන පංචමං
ඛන්ති සච්චමධිට්ඨානං - මෙත්තුපෙක්ඛාතිමේ දස"

iv. බොරු, කේලම්, හිස් වචන, පරුෂ වචන භාවිතයෙන් ඈත්වීම.

v. රජයට අයත් වීම, සොරුන් විසින් පැහැර ගනු ලැබීම, ගින්නෙන් හා ජලයෙන් විනාශයට පත්වීම. තමා ප්‍රිය නොකරන අයට අයත් වීම.

vi. දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව ය.

vii. ඉමස්මිං සති ඉදංහෝති - මෙය ඇති කල්හි මෙය වෙයි.
ඉමස්මිං අසති ඉදං න හෝති - මෙය නැති කල්හි මෙය නොවේ.

viii. ජීවී පරිසරය, අජීවී පරිසරය.

ix. භද්දාලි සූත්‍රය.

x. 11 ශ්‍රේණිය බුද්ධ ධර්මය පෙළ පොතේ - 8 පාඩම පරිශීලනය කරන්න. **(ලකුණු 2 x 10 = 20)**

- **<u>ප්‍රශ්න අංක 2 සිට 6 දක්වා එක ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලැබේ.(ලකුණු 2 + 3 + 5 = 10)</u>**

(2) 1. අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති....
සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ **(ලකුණු 2)**

2. යමෙකු පව් කළොත් එයින් ඔහුම කෙලෙසෙන්නේ ය.යමෙකු පව් නොකලොත් එයින් ඔහු ම පිරිසිදු වන්නේ ය.පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහිම ය.එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකි ය. **(ලකුණු 3)**

3. ධම්මපදය බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය යි.වටිනා උපදෙස් සහිත මෙම ග්‍රන්ථය පරිශීලනය මගින් පුද්ගල ජීවිතය සාර්ථකත්වයට පත්කර ගත හැකිය.

- ධම්ම පදය කෘතියෙන් ලබාදෙන ඔවදන් මගින් හරි,වැරදි ,පින්,පව්, හොඳ, නරක පුද්ගලයාට හඳුනා ගැනීමට මග පෙන්වයි.
- මනා සිහියෙන් කටයුතු කිරීමට,සිතේ සන්සුන් බව ඇති කර ගැනීමට,හරි වැරදි තේරුම් ගැනීමට,වීර්යයෙන් යුතුව කටයුතු කරමින් පුද්ගල දියුණුව වඩවා ගැනීමට මෙම ග්‍රන්ථය බොහෝ සෙයින් මග පෙන්වයි.
- ඇසුරු කළ යුතු හා නොකළ යුතු පුද්ගලයින් හඳුනා ගැනීමට ද මෙම ග්‍රන්ථයේ උපදෙස් මහෝපකාරී වේ.
- සහයෝගයෙන් යුතුව සහ ජීවනයෙන්, චාම් සරල දිවි පැවැත්මෙන් යුතුව වටිනා ජීවිත ගත කරමින් පුද්ගල දිවිය සාර්ථක කරගැනීමට මින් උපදෙස් සපයයි.
- ශිෂ්‍ය පෞරුෂය නිවැරදි ක්‍රියාකාරකම් මගින් ඉදිරියට ගෙන යාමට මෙමගින් ඉතා වටිනා උපදෙස් සපය යි.
- මෙලොව හා පරලොව දෙලොව දියුණුව පිණිස ම මෙම ධම්මපද උපදෙස් පුද්ගලයාට ඉතා වටිනා ධර්ම කරුණු සපය යි.
- ගාථා තුනක් වත් ඇතුළත් කරමින් කරුණු පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. **(ලකුණු 5)**

(3) 1. **සමත භාවනාව** - චිත්ත භාවනාව/සමාධි භාවනාව. **(ලකුණු 2)**
**විදර්ශනා භාවනාව** - විපස්සනා භාවනාව/විදසුන් භාවනාව/ප්‍රඥා භාවනාව/ ත්‍රිලක්ෂණ භාවනාව/ තිලකුණු භාවනාව

2. සමථ හෝ විදර්ශනා යන භාවනාවන්ගෙන් එකක් ප්‍රමාණවත්ව විස්තර කර ඇත්නම් ලකුණු තුනක් ලබා දෙන්න. **(ලකුණු 3)**

3. භාවනාව වැඩීම මගින් තමාට ලබා ගත හැකි ප්‍රයෝජන

- ලෝභ, ද්වේෂ, මෝහ ආදී කෙලෙස් සිතුවිලි පාලනය වේ.
- භාවනාව තුළින් තමාගේ ජීවිතය සාර්ථක කරගැනීම උදෙසා ලැබෙන ප්‍රයෝජන අතර මතක ශක්තිය දියුණු වීම, එක් අරමුණක සිත පිහිටුවාගෙන කටයුතු කළ හැකි වීම, ගැටලු විසඳීමේ හැකියාව වැඩි දියුණු වීම, වහා අවබෝධ කර ගැනීමේ හැකියාව දියුණුවීම, ඉවසීමේ ශක්තිය දියුණුවීම, පිළිවෙලින් යමක් කරගෙන යාමට හැකියාව ලැබීම, මුහුණ පැහැපත් වීම, නිරෝගී බව ඇතිවීම…ආදී කරුණු පෙන්වා දිය හැකි ය.
- විදර්ශනා භාවනාව පුහුණු කිරීම මගින් ජීවිතයේ හා ලෝකයේ යථා ස්වභාවය අවබෝධ කර ගැනීමට හැකිවේ.අෂ්ටලෝක ධර්මයට අනුව මධ්‍යස්ථව කටයුතු කිරීමට හැකි ය.වෙනස්වන සුළු ස්වභාවය වටහා ගැනීම මගින් කායික හා මානසික දුක් පීඩා විඳ දරා ගැනීමට හැකියාව ලැබේ.
මේ අනුව භාවනාව වැඩීම මගින් තමාට ලබා ගත හැකි ප්‍රයෝජන රාශියකි. **(ලකුණු 5)**

(4) 1. ස්ථානය - රජගහ නුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණී නම් ගල් ගුහාව ඉදිරිපිට.
සභය දුන් රජතුමා - අජාසත්ත රජතුමා ය. **(ලකුණු 2)**

2. හේතුව - සුභද්‍ර නම් භික්ෂු නමගේ නුසුදුසු වචනය.
සහභාගී වූ සංඛ්‍යාව - මහා රහතන් වහන්සේලා පන්සිය නමකි.
මූලිකත්වය ගත් මහ රහතන් වහන්සේ - මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ. **(ලකුණු 3)**

3. - විසුරුණු මල් ගොඩක් සේ විසිර තිබූ ධර්මය හා විනය ඒකරාශි කර සංගෘහිත කිරීම පළමු සංගායනාවෙන් සිදු විය.
- ධර්මය හා විනය කරුණු කොටස් කර වෙනම භාණක පරපුරකට පැවරී ය.
- දීඝ නිකාය - ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද
- මජ්ඣිම නිකාය - සැරියුත් තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද
- අංගුත්තර නිකාය - අනුරුද්ධ තෙරුන් ඇතුළු ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද
- සංයුත්ත නිකාය - මහා කාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද
- ඛුද්දක නිකාය සියලුම භික්ෂූන් වහන්සේලාට ද පවරා තිබුණි.මෙය පළමු සංගායනාවේ සුවිශේෂී තීරණය කි.
- විනය පිටකය උපාලි තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවට පවරන ලදී.
- මාගේ ඇවෑමෙන් භික්ෂූන්ගේ එකඟතාවය මත කුඩා, අනු කුඩා ශික්ෂාපද වෙනස් කර ගත හැකි යැයි බුදුරදුන් අනුදැන තිබුණ ද එකී කුඩා අනු කුඩා ශික්ෂාපද නිර්ණය කිරීමේ ගැටළුව මත කුඩා ශික්ෂා පදයක් හෝ වෙනස් නොකිරීමට තීරණය කිරීම. **(ලකුණු 5)**

(5) 1. අප අවට ඇති වටපිටාව පරිසරය ලෙස හඳුන්වා දිය හැකි අතර මෙම පරිසරය ජීවී අජීවී ලෙස කොටස් 2 කට බෙදිය හැකිය.මිනිසා, සත්ත්ව සංහතිය මෙන්ම අචිඤ්ඤානික ගස්වැල් ද අප අවට ඇති පරිසරයේ කොටස් කරුවෝ ය. (ලකුණු **2)**

2. ජීවත්වීමට අවශ්‍ය ඔක්සිජන් වාතය ලැබීම, ජලය ලැබීම, ගස් වැල් හා ඵල ලැබීමට හැකි වීම... ආදි කරුණු තුනක් ලියා තිබේ නම් ලකුණු තුනක් ලබා දෙන්න. (ලකුණු **3)**

3. බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරයට බොහෝ ඇලුම් කළහ.බුදු සිරිතේ බොහෝ කටයුතු ස්වාභාවික පරිසරය හා බැඳී පවතී.
   - බුදු දහමේ පාරිසරික සම්පත් ආරක්ෂා කර ගැනීමට බොහෝ උපදෙස් සපයා ඇති අතර ඉන් ලබාගත හැකි ප්‍රයෝජන ද පෙන්වා දී ඇත.
   - අප අවට පරිසරයේ සියලු සම්පත් මිනිසාගේ ප්‍රයෝජනය සඳහාම වේ.
   - **ජලයට** මුත්‍රා කිරීම, කෙළ ගැසීම, නොකළ යුතු බව බුදු දහමේ පෙන්වා දෙන්නේ එම ජලය පවිත්‍ර ලෙස මිනිසාට ප්‍රයෝජනයට ගැනීමට හැකි ලෙස තබා ගැනීමට ය. ඒ අනුව පිරිසිදු පානීය ජලය මිනිසාට ලැබෙයි.අපවිත්‍ර ද්‍රව්‍ය ජලයට එක් කළ විට එය විශාල පාරිසරික විනාශයකි.මිනිසාගේ විනාශයට ද එයම හේතු වේ.ජලය මනා කළමනාකරණයකින් යුතුව භාවිත කළ යුතු අතර වාරි ජල කළමනාකරණය මගින් වගාවන් ආරක්ෂා කරගනිමින් වැඩි අස්වැන්නක් ද ලැබිය හැකිය.
   - **පිරිසිදු වාතය** මිනිසා නිරෝගි කරයි. වාතයට විෂ වායුන් එක් කළ විට එය ජීවය විනාශයට හේතුවකි. එබැවින් කාබන් ඩයොක්සයිඩ්,කාබන් මොනොක්සයිඩ් ආදී විෂ වායු පරිසරයට එකතු වීම අවම කළ යුතුය.ශාක වැවීම මගින් ඔක්සිජන් වැනි හිතකර වායු පරිසරයට එකතු කරගත හැකිවා මෙන්ම ශාක බහුලත්වය මගින් මිනිසාගේ ආහාර ගැටලුවට ද විසඳුම් ලැබේ. ශාක වැවීම පිං වැඩෙන පිංකම් ය.
   - **පස** සංරක්ෂණයට ශාක වැවීම,ගල් වැටි දැමීම ආදිය කරගත යුතු වේ.පරිසර හිතකාමී සත්ව ප්‍රජාව මගින් පාරිසරික සමතුලිත බව වර්ධනය කරගත හැකි ය.පාරිසරික හානිය අවම වන පරිදි ඉදිකිරීම් කරගත යුතු අතර විෂ ද්‍රව්‍ය පසට එකතු නොකළ යුතු ය.ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය කළ යුතු වීම.පොලිතින් භාවිතය අවම කර ගැනීම ආදිය මගින් පස සංරක්ෂණයට විසඳුම් ලබාගත හැකි ය.
   - පාරිසරික සම්පත් ආරක්ෂා කරන්නේ නම් ගං වතුර, නායයෑම්, සුළි සුළං ආදී ස්වාභාවික විපත් අවම කර ගතහැකි අතර මිනිසාගේ ආයු කාලය ද දීර්ඝ කරගැනීමට එයින් හැකියාව ලැබේ.
   - **පිරිසිදු** පරිසරයක් පවත්වා ගැනීම පිළිබඳ තොරතුරු චුල්ලවග්පාළියේ වත්තක්ඛන්ධකයෙහි ද පෙන්වා දී ඇත.

   මේ ආකාරයට කරුණු තුනක් වත් ඇතුළත් කරමින් පිළිතුර පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ලකුණු **5)**

(6) 1. බුද්ධ ධර්මය 11 ශ්‍රේණිය පෙළ පොතේ 8 පාඩමට අනුව කරුණු දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකක් ලබා දෙන්න. (ලකුණු **2)**

2 උට්ඨාන සම්පදා, ආරක්ඛසම්පදා, කල්‍යාණ මිත්ත්‍රතා, සමජීවිකතා. (ලකුණු **3)**

3. - **උට්ඨාන සම්පදා**

උට්ඨාන සම්පදා ලෙස හඳුන්වා ඇත්තේ,තමන් කරන කවර ම හෝ රැකියාවක් උත්සාහයෙන් දැතේ මහන්සියෙන් දහදිය හෙළා ධාර්මික ක්‍රියා අනුගමනය කරමින් සිදු කළ යුතුය යන්න යි.

- **ආරක්ඛසම්පදා**

ධාර්මිකව උපයාගත් ධනය විනාශ විය හැකි ක්‍රමවලින් විනාශ වීමට ඉඩ නොදී මැනවින් ආරක්ෂා කර ගැනීම "ආරක්ඛසම්පදා" නම් වේ.

- **කල්‍යාණ මිත්තතා**

යහපත් මිත්‍රයන් ඇසුරු කිරීම "කල්‍යාණ මිත්තතා" යන්නෙහි අදහසයි. මෙහිදී වෙසෙසින් සැලකිලිමත් විය යුත්තේ මිනිසාගේ වයස හෝ තරාතිරම හෝ නොව ගතිගුණ කෙරෙහි ය. ඔවුන් සතු සද්ධා,සීල, චාග, පඤ්ඤා යන ගුණ ධර්ම තම ජීවිතයටත් සමීප කර ගැනීම කල්‍යාණ මිත්‍රයන්ගේ ආශ්‍රය තුළින් අපේක්ෂා කරගත යුතු ප්‍රමුඛතම කරුණ යි.

- **සමජීවිකතා**

තමාගේ ආදායම හා වියදම හොඳින් දැන, ආදායමට වඩා වියදම වැඩි නොකොට, අය වැය මනාව තුලනය කර ගැනීම සමජීවිකතාවය යි. (ලකුණු **5)**

(7) පිළිතුරු ලියා ඇති ආකාරය ප්‍රමාණවත් නම් එක පිළිතුරකට ලකුණු පහක් බැගින් කොටස් දෙකට ලකුණු 10 ක් ලබා දෙන්න. (ලකුණු 5 + 5 = 10)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
ශිෂ්‍යත්ව
2013 - 2022
O/L
ඉතිහාසය
සංගීතය
NEW SYLLABUS
2024
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න